# ඇබෑර්තු

# රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පහත සඳහන් තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් කර ඇති පරිදි සුදුසුකම් සපුරාලන මනා ශරීර සෞඛ්‍යයෙන් හා විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01. | භාෂා නිලධාරී | 03 |
| 02. | භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී | 07 |

## 01. භාෂා නිලධාරී

**අධ්‍යාපන සුදුසුකම්**

❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භාෂාව, (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා විෂයන් ලෙස ඇතුළත්) වාග් විද්‍යාව, පරිවර්තන අධ්‍යයනය හෝ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රයනට අදාළව උපාධියක් ලබා තිබිය යුතුය.

## 02. භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී

**2.1. අධ්‍යාපන සුදුසුකම්**

**මූලික සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්ව විද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය හෝ සමාජ විද්‍යාව හෝ භාෂා පිළිබඳ උපාධියක් ලබා තිබීම.
2. පරිපාලනය/සම්බන්ධීකරණය, විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.
3. පරිගණක සාක්ෂරතාවය

**අමතර සුදුසුකම්**

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා තුනම පිළිබඳ දැනුම
2. තොරතුරු තාක්ෂණය/ නීතිය
3. පුවත්පත් කලාව/ ජනසන්නිවේදනය
4. ව්‍යාපෘති කළමනාකරණය
5. පරිවර්තන කටයුතු පිළිබඳව දැනීම

**සාමාන්‍ය තොරතුරු**

**වයස් සීමාව**

2025.07.28 දිනට වයස අවු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

❖ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

❖ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික, මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

❖ විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණ**

1. භාෂා නිලධාරී (JM 1-1- 2025) 72,650-10X1,360-18X2,040-122,970
2. භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී(MA 5-2 2025) 62,310-10X1,360-15X1,670-5X2,040-111,160

විදේශීය විශ්වවිද්‍යාලවලින් ලබාගත් උපාධි සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් රහිත තනතුරු වේ. පත්වීම්ලාභීන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. සේවා යෝජකයාගෙන් 12% කි. සේවකයාගෙන් 8% කි. කොමිෂන් සභාව විසින් පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

තනතුරකට පත්වීමක් ලබන්නෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.ඔහුගේ/ ඇයගේ සේවය වැඩ හා හැසිරීම සතුටුදායක නම් සහ පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත්වී ඇත්නම් පරිවාස කාලය අවසානයේ ඔහු/ඇය සේවයේ ස්ථිර කරනු ඇත. රජයේ සේවකයන් පළාත් බද රාජ්‍ය සේවයෙහි ද ව්‍යවස්ථාපිත මණ්ඩල වලද සංස්ථා වලද සේවය කරන නිලධාරීන් ඉල්ලුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

සුදුසුකම් සහිත ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ/ හෝ ලිඛිත පරීක්ෂණයකට අදාළ පරිදි කැඳවනු ලබන අතර තෝරා ගැනීම සිදුකරනු ලබන්නේ එම සම්මුඛ පරීක්ෂණයක සහ/හෝ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

**ඉල්ලුම්පත්‍ර**

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 2025.07.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, ජනජය සිටි ගොඩනැගිල්ල, 09 වන මහල, නාවල පාර, රාජගිරිය**" යන ලිපිනයට එවිය යුතුයි.

ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුවේ.

මෙම නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව,**
**"ජනජය සිටි ගොඩනැගිල්ල",**
**09 වන මහල, නාවල පාර, රාජගිරිය**
**2025.07.11**